HSBC මාර්ගගත (online) බැංකුකරණ සේවාවන් (පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ සේවාවන්) සඳහා නීතිරීති හා කොන්දේසි

1. සේවාවන්

(a) ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් (මින් මතුවට **'බැංකුව/ HSBC**' යනුවෙන් හැඳින්වෙන අතර, සන්දර්භය විසින් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුම්වලට එහි අනුප්‍රාප්තිකයින් සහ ලැබුම්කරුවන් ද ඇතුළත් වේ) විසින් මෙම නීතිරීති සහ කොන්දේසි වලට යටත් ව කලින් කලට, පොදු ඉලෙක්ට්‍රොනික මුදල් පැවරුම් ස්විචය (CEFTS) / තථ්‍ය වේලාවෙහිම ශුද්ධ පියවීමේ පද්ධතිය (RTGS) / ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති (SLIPS)/ටෙලිග්‍රැෆික් පැවරුම් (TTs) / සහ වෙනත් ඕනෑම ගෙවීම් ක්‍රමවේදයක් ද ඇතුළුව නමුත් ඒට සීමා නොවී, මාර්ගගත සේවාවන් සහ පහසුකම් (**'සේවාවන්'**), බැංකුකරණ, ආයෝජන, මූල්‍ය හා වෙනත් ගනුදෙනු (මෙහි මින්මතු **'ගෙවීම් සහ පැවරුම්'** යනුවෙන් හැඳින්වෙන) සිදුකිරීම සඳහා සහ විවිධ ස්වභාවයේ කටයුතු සිදුකිරීම සඳහා සහ බැංකුව වෙතින් සහ/හෝ HSBC සමූහයේ (**'HSBC සමූහය'** යන්නෙන් HSBC හෝල්ඩින්ස් පීඑල්සී සහ/හෝ එහි උප-ආයතන හා සහයෝගී ආයතන සහ ඒවායෙහි ශාඛාවන් සහ නිලධාරීන් අදහස් වන අතර, "**HSBC සමූහයේ යම් සාමාජිකයෙකු**" යන යෙදුම ද එම අදහස ම දේ) සාමාජිකයින් වෙතින් සේවාවන්, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ හා වරප්‍රසාද ලබාගැනීම සඳහා බැංකුව සමඟ සන්නිවේදනය කිරීමට හා ඊට උපදෙස් දීමට ගනුදෙනුකරුවන්ට ('**ගනුදෙනුකරුවා**' යන යෙදුම මගින් සන්දර්භය විසින් අවශ්‍ය වනවිට ගනුදෙනුකරුවාගේ යම් පෞද්ගලික නියෝජිතයෙකු හෝ නෛතික අනුප්‍රාප්තිකයෙකු ඇතුළත් වනු ඇත) හැකියාව ලබාදෙනු පිණිස බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් පිහිටුවන, මෙහෙයවන සහ/හෝ පවත්වාගෙන යනු ලබන යම් මාර්ගගත නාලිකාවක් {**'මාර්ගගත නාලිකා' - online channel(s)**} හරහා සපයනු ඇත.

(b) බැංකුව විසින් ස්වකීය සේවාවන් හි කොටසක් ලෙස, කිසියම් මාර්ගගත නාලිකාවක් හරහා, යම් තැනැත්තෙකු විසින් සපයන ලද (**'තොරතුරු සපයන්නා'** ලෙස හැඳින්වෙනු ඇති අතර, එම යෙදුම මගින් තොරතුරු සපයන්නෙකු වෙත තොරතුරු සපයා දෙන යම් තැනැත්තෙකු ද අදහස් වනු ඇත) මූල්‍ය, වෙළඳපොළ හෝ වෙනත් තොරතුරු සහ දත්ත (**'තොරතුරු'**) ලබාදෙනු ඇති අතර, තොරතුරු මගින් සකස් කරන ලද වාර්තා (**'වාර්තා'**) යම් ආකෘතියකින්, මාධ්‍යයකින් හෝ ක්‍රමයකින් සපයනු ඇත.

(c) පහත දැක්වෙන දෑ ද ඇතුළත්ව, ඊට සීමා නොවී, ලබාදෙන සේවාවන් හි විෂයපථය හා ස්වභාවය කලින් කලට තීරණය කිරීමට හා වෙනස් කිරීමට බැංකුවට අයිතිය පවතී. එනම්:-

i. ඕනෑම අවස්ථාවක දී සේවාවන් පුළුල් කිරීම, සංශෝධනය කිරීම, හෝ අඩු කිරීම;

ii. සේවාවන් භාවිත කරමින් ගනුදෙනුකරු විසින් සිදුකරන ගනුදෙනුවක වටිනාකම සම්බන්ධයෙන් හෝ ඕනෑම ආකාරයක ගනුදෙනුවක් සම්බන්ධයෙන් හෝ දෛනික උපරිම

හා අවම සීමාවන් පැනවීම වැනි, සේවාවන් භාවිත කිරීම පිළිබඳව යම් සීමාවන් පැනවීම හා වෙනස් කිරීම; සහ

iii. සේවාවන් ලබාගත හැකි වන සාමාන්‍ය සේවා වේලාවන් සහ, යම් සේවාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් දෛනික අවසන් වේලාවන් නියම කිරීම හා වෙනස් කිරීම. අදාළ වන යම් දෛනික අවසන් වේලාවකට පසුව ගනුදෙනුකරු වෙතින් බැංකුව වෙත ලැබෙන යම් උපදෙසක් ඊළඟ ව්‍යාපාරික දිනයේ (අප විසින් අන්‍යාකාරයකින් දක්වා නොමැති නම් මිස, ව්‍යාපාරික දිනය යනුවෙන් අදහස් වන්නේ, ශ්‍රී ලංකාවේ බැංකුකරණ/වැඩකරන දිනයක් සහ සාමාන්‍ය බැංකුකරණ/වැඩකරන පැය වේ) දී ලැබී ඇතැයි සැලකෙනු ඇත. විවිධ වේලා කලාපයන් හි මෙහෙයවෙන විවිධ වෙළඳපොළ වේලාවන් සලකා බලා බැංකුව විසින් ව්‍යාපාරික දිනය සහ දෛනික අවසන් වේලාවන් නියම කරනු ඇත.

(d) සේවාවන් ලබාගැනීමේ කාර්යය සඳහා බැංකුව විසින් යම්කිසි ගිණුමක් (ගිණුම්) නම් කිරීමට හෝ ලියාපදිංචි කිරීමට ගනුදෙනුකරුට නියම කළ හැකිය.

(e) ගනුදෙනුකරු විසින් අන්තර්ජාල බ්‍රවුසරයක් සහ/හෝ ජංගම දුරකථන බ්‍රවුසරයක් සහ/හෝ ජංගම දුරකථන යෙදුමක් සහ/හෝ ඩිජිටල්/ජංගම උපකරණ වැනි යම් ක්‍රමයක් උපයෝගී කරගෙන සේවාවන් භාවිත කළ හැකි ය.

2. පාලනය වන නීතිරීති සහ කොන්දේසි

සේවාවන් මඟින් ගිණුම් මෙහෙයවීමට, ගනුදෙනු සිදුකිරීමට සහ, කලින් කලට ලබාගත හැකි වන ආකාරයට බැංකුව වෙතින් සහ/හෝ HSBC සමූහයේ අනෙක් සාමාජිකයින් වෙතින් සේවා, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබාගැනීමට ගනුදෙනුකරු වෙත අතිරේක ක්‍රමයක් සැපයේ. සේවාවන් භාවිත කරමින් සිදුකරන ලද ගනුදෙනු සාමාන්‍ය නීතිරීති හා කොන්දේසිවලට සහ බැංකුවේ වෙබ් අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කර ඇති බැංකුවේ සාමාන්‍ය වියාචනයට සහ අන්තර්ජාල ප්‍රතිපත්ති ප්‍රකාශනයට යටත් වේ. අදාළ ගිණුම්, ගනුදෙනු, සේවා, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ හෝ වරප්‍රසාද පාලනය වන අනෙකුත් සියලු නීතිරීති සහ කොන්දේසි අඛණ්ඩව අදාළ වනු ඇති නමුත්, වෙනසක් දක්නට ඇති අවස්ථාවක දී සේවාවන් සම්බන්ධයෙන් මෙම නීතිරීති හා කොන්දේසි බලපැවැත්වෙනු ඇත.

3. සේවාවන් භාවිතය

(a) පළමු වතාවට සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා, ගනුදෙනුකරු මාර්ගගතය (online) හරහා හෝ බැංකුව විසින් කලින් කලට නියම කරනු ඇති වෙනත් යම් ආකාරයකින් ලියාපදිංචි විය යුතු අතර,

සේවාවන් භාවිතය පාලනය වන සියලුම නීතිරීති හා කොන්දේසි පිළිගන්නා බව දැක්විය යුතු අතර, ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා බැංකුව විසින් සාධාරණව නියම කරනු ඇති යම් යම් තොරතුරු සැපයිය යුතු ය.

(b) සේවාවන් භාවිතය සඳහා ලියාපදිංචි වීම මගින් සේවාවන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත සපයා ඇති සියලු තොරතුරු සත්‍ය, සම්පූර්ණ හා යාවත්කාලීන බවට ගනුදෙනුකරු තහවුරු කරයි.

(c) සේවාවන් සපයනු ලබන්නේ ගනුදෙනුකරුගේ තනි සහ විශේෂිත භාවිතය පිණිස ය.

(d) සේවාවන්, තොරතුරු සහ/හෝ වාර්තා නීතිවිරෝධී අරමුණක් හෝ කාර්යයක් සඳහා භාවිත නොකළ යුතු අතර, වෙනත් යම් තැනැත්තෙකුට භාවිත කිරීමට ද ගනුදෙනුකරු විසින් දැනුවත්ව ඉඩ නොදිය යුතුය. එවැනි භාවිත කිරීමක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු දැනගතහොත්, හැකි තාක් ඉක්මනින් ඔහු/ඇය විසින් ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

(e) අන්තර්ජාලය හරහා සිදුකළ ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස බැංකුව විසින් මාර්ගගත නාලිකාවේ (නාලිකාවල) හෝ වෙනත් ආකාරයකින් දක්වා ඇති විනිමය අනුපාත, පොලී අනුපාත, ගනුදෙනු අනුපාත සහ වෙනත් යම් මිල ගණන් හා තොරතුරු, පරිශීලනය සඳහා පමණක් වන අතර, බන්ධනීය නොවේ. බැංකුව විසින් අදාළ ගනුදෙනුව සඳහා ලබාදෙන අනුපාතයන්, මිල සහ තොරතුරු ගනුදෙනුකරු විසින් පිළිගන්නා බව තහවුරු කිරීමෙන් පසු, බැංකුව විසින් වෙනස් අනුපාතයක්, මිලක් හෝ තොරතුරක් ගෙනහැර දැක්වීම නොතකා, ගනුදෙනුකරු මත බන්ධනීය වනු ඇත.

(f) උපදෙස් සම්ප්‍රේෂණය කිරීමේ දී කාල ප්‍රමාදයක්, අන්තර්ජාලය හරහා තොරතුරු හෝ සන්නිවේදනය කිරීමේ දී පූර්ණ හෝ අර්ධ අතපසුවීමක් හෝ විකෘති වීමක් හෝ සිදුවිය හැකි බවට සහ, කවරාකාරයකින් හෝ සිදුවන එවැනි ප්‍රමාදයක් සම්බන්ධයෙන් බැංකුව වගවීමට ලක් නොකරන බවට ගනුදෙනුකරු පිළිගෙන, එකඟ වේ.

4. පරිශීලක හැඳුනුම් කේතය සහ මුරපදය

(a) සේවාවන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා පරිශීලක හඳුනාගැනීමේ කේතය (‘**පරිශීලක හැඳුනුම් කේතය**’) සහ ප්‍රවේශ වීමේ මුරපදය (‘**මුරපදය**’) සකස් කිරීමේ දී බැංකුව විසින් සපයා ඇති මඟපෙන්වුම ගනුදෙනුකරු විසින් අනුගමනය කළ යුතු වේ.

(b) ගනුදෙනුකරු විසින් ඕනෑම අවස්ථාවක දී මුරපදය වෙනස් කළ හැකි නමුත් කිසියම් වෙනස් කිරීමක් බලාත්මක වනු ඇත්තේ බැංකුවේ මාර්ගගත නාලිකාව විසින් එය පිළිගතහොත් පමණි. හඳුනාාගැනීමේ කේතය ගනුදෙනුකරු විසින් වෙනස් කළ නොහැක.

(c) බැංකුව විසින් සිත තනි අභිමතය පරිදි, සේවාවන් වෙත ප්‍රවේශ වීම පිණිස ආරක්ෂිත කේතයක් (ආරක්ෂක උපකරණය විසින් උත්පාදනය කෙරෙන, එක් අවස්ථාවක් සඳහා පමණක් වන මුරපදය) (ආරක්ෂිත කේතය යනු, ආරක්ෂිත කේතය උත්පාදනයට භාවිත කරන ඉලෙක්ට්‍රොනික උපකරණයකි) හෝ HSBC ජංගම බැංකුකරණ යෙදුම මත ගැළපෙන ජංගම උපකරණයක සක්‍රීය කරන ලද ඩිජිටල් ආරක්ෂක යතුර භාවිත කරන ලෙස ගනුදෙනුකරුට නියම කළ හැකි අතර, එවැනි අවස්ථාවක දී ආරක්ෂිත උපාංගයක් බැංකුව වෙතින් අයදුම් කිරීමේ හෝ පෙරාතුව නිකුත් කර ඇති ආරක්ෂිත උපාංගය ඉන් පසුව නැතිවී හෝ අවශ්‍ය පරිදි ක්‍රියා නොකරන විටෙක හෝ ඒ වෙනුවෙන් නව උපාංගයක් ඉල්ලා සිටීමේ හෝ සක්‍රීය කරන ලෙසට ඉල්ලා සිටීමේ සම්පූර්ණ වගකීම ගනුදෙනුකරු වෙත පවතියි.

(d) පරිශීලක කේතය, මුරපදය, ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර සක්‍රීය කළ ආරක්ෂක උපකරණය හෝ ජංගම උපකරණය සහ ආරක්ෂිත කේතය රහස්‍ය ලෙස තබාගැනීමට ගනුදෙනුකරු විසින් සද්භාවයෙන් යුතුව ප්‍රමාණවත් සැලකිල්ලකින් හා උද්‍යෝගයකින් යුතුව කටයුතු කළ යුතුය. ගනුදෙනුකරු විසින් කිසිදු අවස්ථාවක දී කිසිදු තත්ත්වයක් යටතේ සිය පරිශීලක කේතය, මුරපදය සහ/හෝ ආරක්ෂිත කේතය, කිසිදු තැනැත්තෙකු වෙත හෙළිදරව් නොකළ යුතු අතර, ඩිජිටල් ආරක්ෂක යතුර සක්‍රීය කළ ආරක්ෂක උපකරණය හෝ ජංගම උපකරණය හෝ වෙනත් අයෙකුගේ සන්තකයේ හෝ පාලනයේ තබාගැනීමට ඉඩ හැරීම හෝ ගනුදෙනුකරු විසින් නොකළ යුතු ය.

(e) පරිශීලක කේතය, මුරපදය සහ/හෝ ආරක්ෂිත කේතය වෙනත් තැනැත්තෙකු වෙත අහඹු ලෙස හෝ අනවසරයෙන් හෝ හෙළිදරව් වීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු සම්පූර්ණයෙන් වගකිව යුතු වන අතර, පරිශීලක කේතය, මුරපදය සහ ආරක්ෂක උපකරණය / ඩිජිටල් ආරක්ෂක යතුර සක්‍රීය කළ ජංගම උපකරණය හෝ ආරක්ෂක කේතය අනවසර පුද්ගලයන් විසින් හෝ අනවසර කාර්යයන් සඳහා හෝ භාවිත කරනු ලැබීම පිළිබඳව ගනුදෙනුකරු අවදානම දැරිය යුතුය.

(f) පරිශීලක කේතය සහ/හෝ මුරපදය යම් අනවසර තැනැත්තෙකු වෙත හෙළිදරව් වී ඇති බව හෝ සේවාවන් අනවසරයෙන් භාවිත කර ඇති බව දැනගැනීමේ දී හෝ සැක කිරීමේදී ගනුදෙනුකරු පුද්ගලිකව හැකි තාක් ඉක්මනින් හෝ බැංකුව විසින් කලින් කලට නියම කරන යම් දුරකථන අංක (අංකයක්) වෙත දුරකථනයෙන් හෝ ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු වන අතර, (එසේ ලබාදෙන තොරතුරු ලිඛිතව තහවුරු කරන ලෙස බැංකුව විසින් ගනුදෙනුකරුගෙන් ඉල්ලා සිටිය හැක) එවැනි යම් දැනුම්දීමක් සත්‍ය වශයෙන් ම බැංකුව වෙත ලැබෙන තෙක් අනවසර පුද්ගලයන් විසින් හෝ

අනවසර අරමුණක් සඳහා සේවාවන් භාවිත කිරීමක් සහ සියලු ම භාවිතයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වේ.

5. ගනුදෙනුකරුගේ උපදෙස්

5.1 සාමාන්‍ය

(a) බැංකුව විසින් කලින් කලට නියම කරනු ඇති පරිදි සේවාවන්ට ප්‍රවේශ වීම සඳහා සහ මාර්ගගතය මගින් බැංකුව වෙත උපදෙස් දීම සඳහා ගනුදෙනුකරු විසින් පරිශීලක කේතය, මුරපදය සහ ආරක්ෂිත කේතය හා බැංකුව විසින් කලින් කලට නියම කරනු ඇති පරිදි වෙනත් යම් හඳුනාගැනීමේ සංකේතයක් සඳහන් කළ යුතු වේ. බැංකුව විසින් කලින් කලට නියම කරනු ඇති යම් ආකාරයකින් ලබා දී ඇත්නම් සහ බැංකුව වෙත ඒවා නිසියාකාර වශයෙන් ම ලැබෙන තෙක්, සේවාවන් සම්බන්ධයෙන් වන උපදෙස් බැංකුව වෙත ලැබී ඇති බවට නොසැලකෙනු ඇත.

(b) පරිශීලක කේතය, මුරපදය සහ ආරක්ෂිත කේතය හා බැංකුව විසින් නියම කර ඇති පරිදි වෙනත් යම් හඳුනාාගැනීමේ සංකේතයක් දක්වමින් සේවාවන් සම්බන්ධයෙන් ලබා දී ඇති යම් උපදෙසක්, වරක් ලබා දුන් පසුව බැංකුවේ හෝ HSBC සමූහයේ අදාළ සාමාජිකයාගේ කැමැත්ත රහිතව අවලංගු කිරීමක් හෝ ආපසු හැරවීමක් සිදුකළ නොහැක. එසේ ලබාදෙන සියලු උපදෙස් බැංකුව හෝ හෝ HSBC සමූහයේ අදාළ සාමාජිකයා විසින් හෝ තේරුම් ගෙන, සද්භාවයෙන් ක්‍රියා කරනු ඇති අතර, ඒවා ලබාදෙන ලද්දේ ගනුදෙනුකරු විසින් හෝ ගනුදෙනුකරු බවට අඟවමින් වෙනත් තැනැත්තෙකු විසින් වුවද, ඒවා අවලංගු කළ නොහැකි වන අතර ගනුදෙනුකරු මත බන්ධනීය වනු ඇත. ගනුදෙනුකරුගේ පරිශීලක කේතය, මුරපදය සහ ආරක්ෂිත කේතය හා බැංකුව විසින් නියමකර ඇති පරිදි වෙනත් යම් හඳුනාගැනීමේ සංකේතයක් (ඇත්නම්) තහවුරු කරගැනීම හැර, එවැනි යම් උපදෙසක් ලබාදෙන තැනැත්තාගේ අනන්‍යතාව හෝ බලය හෝ එවැනි යම් උපදෙසක නිර්ව්‍යාජ භාවය තහවුරු කරගැනීම සඳහා බැංකුවට සහ HSBC සමූහයේ අදාළ සාමාජිකයා හට කිසිදු වගකීමක් නොමැත.

(c) යම් උපදෙසක් බැංකුවේ මතය අනුව ප්‍රායෝගික වන්නේ නම් සහ සාධාරණ වන්නේ නම් සහ සිය සාමාන්‍ය ව්‍යාපාරික පරිචයන් සහ කාර්යපටිපාටිවලට අනුකූල වන්නේ නම් පමණක්, ඒ තාක් දුරට එම උපදෙස් මත ක්‍රියා බැංකුව ක්‍රියා කරනු ඇත.

(d) යම් උපදෙසක් ලැබී ඇති බවට සහ/හෝ ගනුදෙනුවක් සේවාවන් හරහා සිදුකර ඇති බවට උපදෙසක් හෝ තහවුරු කිරීමක් බැංකුව විසින් මාර්ගගතය හරහා සපයනු ඇත. එවැනි උපදෙසක් හෝ තහවුරු කිරීමක් සම්ප්‍රේෂණය කළ වහාම ගනුදෙනුකරු වෙත ලැබී ඇතැයි සැලකෙනු ඇති අතර, එවැනි උපදෙසක් හෝ තහවුරු කිරීමක් පරීක්ෂා කිරීම ගනුදෙනුකරුගේ වගකීම වනු ඇත. එවැනි

උපදෙසක් හෝ තහවුරු කිරීමක් සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වන කාලසීමාව තුළ ගනුදෙනුකරු වෙත උපදෙසක් හෝ තහවුරු කිරීමක් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා බැලීම ද ගනුදෙනුකරුගේ වගකීමකි.

(e) මාර්ගගත නාලිකාව (නාලිකා) හරහා ලබාදුන් යම් ගිණුමක් හෝ සිදු කළ ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන තොරතුරු පරිශීලනය සඳහා පමණකි. එවැනි යම් ගිණුමක් සහ ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකුවේ වාර්තා, ඊට පටහැනි යමක් තහවුරු කරන තෙක් අවසානාත්මක වනු ඇත.

5.2 ගෙවීම් සහ පැවරීම් ආශ්‍රිත විශේෂ කොන්දේසි

ගනුදෙනුකරු පහත පරිදි මෙමගින් එකඟ ව, පිළිගනියි;

5.2 **(a)** CEFTS ගනුදෙනු ඇතුළුව නමුත් ඊට සීමා නොවී සපයන ලද සියලු තොරතුරු පැහැදිලි, සම්පූර්ණ සහ නිවැරදි විය යුතු බව සහ සපයන ලද යම් අසම්පූර්ණ හෝ ප්‍රමාණවත් නොවන තොරතුරු වල ප්‍රතිඵලයක් වශයෙන් නියෝත/ප්‍රතිලාභී බැංකුව විසින් ගෙවීම් උපදෙස් ප්‍රමාද වීම, ප්‍රතික්ෂේප වීම හෝ ආපසු හැරවීම සිදුවිය හැකි අතර, අදාළ පරිදි, නියෝත/ප්‍රතිලාභී බැංකුවේ සහ/හෝ HSBC හි අය කිරීම් වලට විෂය විය හැකිය. එවැනි ප්‍රතික්ෂේප වීමක්, ආපසු හැරවීමක් සහ/හෝ ප්‍රමාදයක් සම්බන්ධයෙන් පැන නැගෙන සහ ගනුදෙනුකරු සහ/හෝ වෙනත් ඕනෑම පුද්ගලයකු හට විඳින්නට සිදුවන කිසිනු පාඩුවක්, හානියක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් HSBC විසින් භාර නොගනියි. නියෝත සහ/හෝ ප්‍රතිලාභී බැංකුව විසින් පනවනු ලබන ඕනෑම අය කිරීමක්, ගෙවීම් මුදලින් හෝ බැංකුව විසින් රඳවාගෙන පවතින ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වලින් හෝ අඩු කෙරෙනු ඇත.

5.2 (b) ගෙවීම් සහ පැවරුම් සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු කිරීමේ දී, බැංකුව විසින් ගනුදෙනුකරු සපයන ලද ප්‍රතිලාභී ගිණුම් විස්තර භාවිත කිරීම හෝ තහවුරු කිරීම හෝ සිදු නොකරනු ඇත. ගෙවීම් සහ පැවරුම් ක්‍රියාත්මක කරන ලෙසට ගනුදෙනුකරු විසින් අවලංගු කළ නොහැකි පරිදි බැංකුවට බලය පවරනු ලබන අතර, ගෙවීම් සහ පැවරුම් ක්‍රියාත්මක කිරීම මගින් පැන නගින කිසිදු පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගන්නා බවට ගනුදෙනුකරු පිළිගනියි.

5.3 (c) සම්ප්‍රේෂණය කළ ගෙවීම් සහ පැවරුම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ප්‍රතිලාභී බැංකුව විසින් යොදා ගන්නා ලද තහවුරු කිරීමේ කාර්යපටිපාටි, ප්‍රතිලාභී බැංකුවේ අභ්‍යන්තර කාර්යපටිපාටි වලට අනුව වෙනස් විය හැකිය. එවැනි ගෙවීම් සහ පැවරුම් උපදෙස් මග සන්නිවේදනයට හෝ ක්‍රියා කිරීමට හෝ නියෝග හෝ ප්‍රතිලාභී බැංකුව අසමත් වීම මගින් හෝ ඒ සම්බන්ධයෙන් හෝ පැන නගින

කිසිදු පාඩුවක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු හෝ වෙනත් කිසිදු පාර්ශ්වයක් වෙත බැංකුවෙහි වගවීමක් නොමැත.

5.4 (d) ගනුදෙනුකරුවන්ට අදාළ CEFTS ඇතුළත්ව, නමුත් ඊට සීමා නොවී, ගෙවීම් සහ පැවරීම් සම්බන්ධයෙන් උපරිම දෛනික ගනුදෙනු සීමාවක් තීරණය කිරීමේ පරම අභිමතය බැංකුව විසින් රඳවා ගනු ලබන අතර, යම් වංචාවක්, නෛතික/නියාමන වෙනසක් හේතුවෙන් අවශ්‍ය වුවහොත් මිස, ගනුදෙනුකරුවන් වෙත පූර්ව දැනුම්දීමකින් යුතුව ලබාදිය හැකි සීමාවන් වෙනස් කිරීමේ/ආපසු හැරවීමේ අයිතිය ද රඳවා ගනු ලබයි. එවැනි වෙනස්කම්, බැංකුව සතුව පවතින ලියාපදිංචි ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවුඩ සේවාව (SMS) හරහා හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් සන්නිවේදන මාර්ගයක් යොදා ගැනීමෙන් හෝ ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ලබන අතර, එය ගනුදෙනුකරු වෙත ලබා දුන් නිසි දැනුම්දීමක් ලෙසට සලකනු ලැබේ.

6. ගාස්තු

ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර සපයාදීම සඳහා ගාස්තුවක් නියම කිරීම ද ඇතුළත්ව, ඊට සීමා නොවී, සේවාවන් භාවිතය සහ/හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් ගාස්තු අයකිරීමට ද, බැංකුව විසින් ශ්‍රී ලංකාවේ සිය ශාඛාවන් හි සහ/හෝ බැංකුවේ නිල වෙබ්අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කරනු ලබන බැංකුවේ පවත්නා ගාස්තු ලේඛනය අනුව එම ගාස්තු සංශෝධනය කිරීමට ද අයිතිය බැංකුව රඳවා ගනියි. යම් ගාස්තුවක් තීරණය කර ඒවා බලාත්මක වීමට පෙර එම ගාස්තු අනුපාතය සම්බන්ධයෙන් කලින් කලට බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ප්‍රමාණවත් දැනුම්දීමක් සිදුකරනු ඇති අතර, ගනුදෙනුකරු විසින් එම බලාත්මක දින හෝ ඊට පසුව සේවාවන් අඛණ්ඩව භාවිත කරන්නේ නම් හෝ පවත්වාගෙන යන්නේ නම් ගනුදෙනුකරු එමගින් බැඳී සිටිනු ඇත. බැංකුව විසින් නියම කරනු ඇති පරිදි යම් ආකාරයකින් සහ යම් කාලාන්තරවල දී ගනුදෙනුකරු වෙතින් ගාස්තු අය කෙරෙනු ඇත.

7. ගනුදෙනුකරු විසින් පොරොන්දුවීම් හා ගනුදෙනුකරුගේ වගකීම්

(a) සේවාවන් සැපයීමේ කාර්යය සඳහා බැංකුව විසින් කලින් කලට සාධාරණ ලෙස ඉල්ලා සිටින යම් යම් තොරතුරු ගනුදෙනුකරු විසින් සැපයිය යුතුය. ගනුදෙනුකරුගේ ලිපිනය, සහ සම්බන්ධතා තොරතුරු ද ඇතුළත්ව, ඊට සීමා නොවී, බැංකුව වෙත සපයන සියලු ම තොරතුරු සියලු ම අවස්ථාවන් හි දී නිවැරදි, සම්පූර්ණ සහ යාවත්කාලීන බවට ගනුදෙනුකරු වගබලාගත යුතුය.

(b) ගනුදෙනුකරුට, ගනුදෙනුකරුගේ ගිණුමට (ගිණුම්වලට) සහ/හෝ ගනුදෙනුකරු වෙනුවෙන් බැංකුව විසින් සිදු කළ ගනුදෙනුවකට (ගනුදෙනුවලට) සම්බන්ධ තොරතුරු ගනුදෙනුකරු වෙනුවෙන්

බැංකුව විසින් ගනුදෙනු සිදුකරන බලප්‍රදේශයක යම් බලාධිකාරියක හෝ එවැනි බලප්‍රදේශයක යම් විනිමය, රාජ්‍ය හෝ නියාමක අධිකාරියක යම් නීතියක්, රීතියක් හෝ රෙගුලාසියක් මගින් බැංකුව විසින් හෙළිදරව් කිරීමට නියම වන තැනැත්තෙකු (තැනැත්තන්) වෙත (නීතියෙන් නියම කළ ද නොකළ ද) හෙළිදරව් කිරීමට සහ ලබාදීමට ගනුදෙනුකරු බැංකුවට අවසර දෙයි.

(c) සේවාවක යම් කොටසක් හෝ අන්තර්ජාල අඩවිය හෝ ඒවායෙහි අඩංගු යම් මෘදුකාංගයක් විසංග්‍රහ කිරීම, ප්‍රති-ඉංජිනේරුකරණය, පරිවර්තනය, හැරවීම, අනුරූපකිරීම, සංශෝධනය කිරීම, නවීකරණය, වැඩිදියුණු කිරීම, ඊට යමක් එකතු කිරීම, මකා දැමීම හෝ කිසියම් ආකාරයකින් අපවේශනය කිරීම හෝ ඊට ප්‍රවේශ වීම ගනුදෙනුකරු විසින් නොකළ යුතු අතර, ඊට උත්සාහ දැරීම ද නොකළ යුතුය.

(d) අලෙවි කාර්යයන් සඳහා වෙළඳපොළ මිළ ගණන් සහ අනුපාතයන් ඔහුගේ/ඇයගේ සාමාන්‍ය වෙළඳ මාර්ග ඔස්සේ ස්වාධීනව නිශ්චය කරගැනීම, ඒ මත විශ්වාසය තැබීමට හෝ ක්‍රියා කිරීමට පෙර යම් තොරතුරක් සහ/හෝ වාර්තාවක් තහවුරු කරගැනීම සහ සේවාවන්, තොරතුරු හා වාර්තා භාවිත කිරීම සම්බන්ධයෙන් නෛතික, බදු හා වෙනත් කරුණු, මෙම නීතිරීති හා කොන්දේසි සහ අදාළ සියලු නීති යටතේ ගනුදෙනුකරුට බලපානු ඇති ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම ගනුදෙනුකරුගේ වගකීමක් බව ගනුදෙනුකරු පිළිගනියි.

8. තොරතුරු සහ තොරතුරු සපයන්නන්

(a) තොරතුරු, වාර්තා සහ ඒවා තෝරාගැනීමේ, වින්‍යාසයේ, ඉදිරිපත් කිරීමේ හා ප්‍රකාශනයේ ආකාරය, ආකෘතිය, විසංග්‍රහ කිරීමේ රීතිය හා ක්‍රමවේදය (සාමූහිකව **'රහස්‍ය තොරතුරු'**) වෙළඳ රහස් බවට හා රහස්‍ය බවට ද බැංකුවේ හා අදාළ තොරතුරු සපයන්නන්ගේ හිමිකාරීත්වය ඇති දේපල බවට ද ගනුදෙනුකරු පිළිගෙන, එකඟ වේ.

(b) මෙම නීතිරීති හා කොන්දේසි මගින් ප්‍රකාශිතව අවසර දී ඇත්නම් හැර, ගනුදෙනුකරු පහත දෑ සිදුකිරීම සහ සිදුකිරීමට තැත් කිරීම නොකළ යුතුයඃ-

i. කිසිදු ආකෘතියකින් හෝ කිසිදු ආකාරයකින් වෙනත් යම් තැනැත්තෙකු වෙත රහස්‍ය තොරතුරු විකිණීම, මාරුකිරීම, හෙළිදරව් කිරීම, ලබාදීම, බදු දීම, අනු-බලපත්‍ර දීම, බෙදාගැනීම, ණයට දීම, බෙදාහැරීම, සම්ප්‍රේෂණය, විකාශනය, රැහැන් ඔස්සේ විකාශනය, සංසරණය කරවීම, බාගත කිරීම, ප්‍රතිනිෂ්පාදනය, පිටපත් කිරීම හෝ වෙනත් ආකාරයකින් සැපයීම හෝ බෙදාහැරීම හෝ, යම් රහස්‍ය තොරතුරක් වාණිජ වශයෙන් අපයෝජනය කිරීම;

ii. රහස්‍ය තොරතුර මත හෝ ඒ සමග දැක්වෙන, යම් වෙළඳ ලකුණක් හෝ කර්තෘ අයිතිය පිළිබඳ දැන්වීමක් ද ඇතුළත්ව, ඊට සීමා නොවී, යම් හිමිකාරිත්ව සලකුණක් ඉවත් කිරීම, විනාශ කිරීම, මකා දැමීම, නැවත ස්ථානගත කිරීම, හෝ කිසිදු ආකාරයකින් වෙනස් කිරීම; හෝ

iii. රහස්‍ය තොරතුර වෙනත් යම් වැඩසටහනක් තුළ අන්තර්ගත කිරීම හෝ ඊට සම්බන්ධ කිරීම.

(c) හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ඇති සීමා කිරීම් පහත දැක්වෙන යම් රහස්‍ය තොරතුරකට අදාළ නොවනු ඇත. එනම්:-

i. එය හෙළිදරව් කිරීමට නීතියෙන් බලකෙරෙන අවස්ථාවක දී. එනමුත් නීතියෙන් නියම කෙරෙන ප්‍රමාණයට පමණක් සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව සම්බන්ධව ලිඛිත දැන්වීමක් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබාදීමෙන් පසුව පමණක්; හෝ

ii. එය හෙළිදරව් කිරීමට බැංකුව විසින් ප්‍රකාශිතව ලිඛිතව එකඟ වී ඇති අවස්ථාවක දී.

(d) රහස්‍ය තොරතුරට ඇති සහ ඒ සම්බන්ධ සියලු ම අයිතිවාසිකම්, හිමිකම් සහ අයිතීන් සහ, ඊට සම්බන්ධ කර්තෘ අයිතීන්, පේටන්ට්, වෙළඳ ලකුණු, සේවා ලකුණු, හිමිකාරිත්ව දේපල, වෙළඳ රහස් හා අනන්‍ය කටයුතු බැංකුවේ සහ අදාළ තොරතුරු සපයන්නන්ගේ අනන්‍ය දේපල බවට ද, එසේ ම පවතිනු ඇති බවට ද ගනුදෙනුකරු එකඟ වේ. මෙම නීතිරීති හා කොන්දේසිවලට යටත්ව තොරතුරු හා වාර්තාවලට ප්‍රවේශ වීමේ අයිතිය හැර වෙනත් කිසිදු අයිතිවාසිකමක්, හිමිකමක් හෝ අයිතියක් ගනුදෙනුකරු වෙත පැවරීම හෝ ලබාදීම නොකෙරේ. ගනුදෙනුකරුට ඊට යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ අයිතියක් ඇති බවට හැඟවෙන ආකාරයේ කිසිදු නියෝජනයක් කිරීම හෝ යම් ක්‍රියාවක් කිරීම ගනුදෙනුකරු නොකළ යුතු වේ.

(e) තොරතුරු සපයන්නෙකු විසින් එය විසින් සපයනු ලබන යම් තොරතුරක් ලබාගැනීම සම්බන්ධයෙන් කලින් කලට නීතිරීති හා කොන්දේසි පැනවිය හැකිය. බලාත්මක දිනයේ දී හෝ ඉන් පසුව ගනුදෙනුකරු විසින් එවැනි තොරතුරුවලට ප්‍රවේශ වීම පූර්ව දැනුම්දීමකට යටත්ව ගනුදෙනුකරු විසින් එම නීතිරීති සහ කොන්දේසි පිළිගැනීමක් සංස්ථාපනය කරයි.

(f) තොරතුරු සහ වාර්තා ලබාදෙනු ලබන්නේ පරිශීලනය සඳහා පමණක් වන අතර, වෙළඳ හෝ වෙනත් කාර්යයන් සඳහා අරමුණු නොකෙරේ. බැංකුව හෝ යම් තොරතුරු සපයන්නෙකු හෝ ගනුදෙනුකරු සඳහා ආයෝජන උපදේශකයෙකු ලෙස නොසැලකිය යුතුය.

(g) බැංකුව හෝ යම් තොරතුරු සපයන්නෙකු විසින් යම් තොරතුරක හෝ වාර්තාවක පිළිවෙල, නිවැරදි භාවය, සත්‍යය, විශ්වසනීය බව, ප්‍රමාණවත් බව, කාලීන බව හෝ සම්පූර්ණ බව පිළිබඳව හෝ,

එය කිසියම් කාර්යයක් සඳහා යෝග්‍ය බව සහතික වීම හෝ නියෝජනය කිරීම නොකරයි. තොරතුර හෝ වාර්තාව මත ගනුදෙනුකරු හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ විශ්වාසය තැබීමක් සම්බන්ධව එම කිසිවෙකු (දීලික්ත හෝ ගිවිසුම් හෝ වෙනත් ආකාරයේ) කිසිදු වගකීමක් භාර නොගනියි.

(h) තොරතුරු, ඒවා සැපයෙන ආකාරයෙන් ම සහ ඒවා බැංකුව වෙත සෘජුව ම සපයන තොරතුරු සපයන්නා හඳුන්වමින් ලබාදෙනු ඇත. කිසියම් තොරතුරු සපයන්නෙකු විසින් සපයන කිසිදු තොරතුරක් අනුමත කිරීම හෝ යම් අදහසක් ප්‍රකාශ කිරීම බැංකුව විසින් සිදු නොකරන අතර, යම් තොරතුරක් පරීක්ෂා කිරීමට හෝ තහවුරු කරගැනීමට කිසිදු වගකීමක් ද නොදරයි.

i. තොරතුරු සහ/හෝ වාර්තා සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ඇපවීමක්, නියෝජනයක් හෝ සහතිකවීමක් ලබාදීම හෝ හැඟවීම නොකරන අතර, එවැනි ඇපවීමක්, නියෝජනයක් හෝ සහතිකවීමක් ලබාදීමට බැංකුවේ කිසිදු සේවකයෙකුට හෝ නියෝජිතයෙකුට හෝ යම් තොරතුරු සපයන්නෙකුට බලය ලබා දී නොමැත.

9. බැංකුවෙහි වගකීම්

(a) සේවාවන් සම්බන්ධ බැංකුවේ පද්ධතියට ප්‍රමාණවත් ආරක්ෂක සැලසුම් අන්තර්ගත වන බවට සහතික වීම සඳහා සහ පද්ධතිය මෙහෙයවීමේ දී ඇතිවන අවදානම් පාලනය කර, කළමනාකරණය කිරීම සඳහා, කලින් කලට බැංකුවට අදාළ වනු ඇති කිසියම් නීති, රීති, රෙගුලාසි, මඟපෙන්වීම්, චක්‍රලේඛ, චර්යාධර්ම පද්ධති සහ පවතින වෙළඳපොල පරිචයන් සැලකිල්ලට ගෙන සාධාරණව ප්‍රායෝගික පියවර බැංකුව විසින් ගනු ඇත.

(b) සේවාවන්, තොරතුරු හා වාර්තා ගනුදෙනුකරුගේ දෘඩාංග, මෘදුකාංග හෝ උපකරණවලට හානිකර ලෙස බලපාන වෛරස හෝ වෙනත් විනාශකාරී අංගවලින් තොර බවට බැංකුව, HSBC සමූහයේ කිසිදු සාමාජිකයෙක් හෝ යම් තොරතුරු සපයන්නෙක් විසින් සහතික වීමක් හෝ නියෝජනය කිරීමක් නොකරයි.

(c) අවශ්‍ය විට සහ අවශ්‍ය පරිදි සේවාවන්ට ප්‍රවේශ වීමට අවසර දීම සඳහා ගනුදෙනුකරු වෙත සපයා ඇති ආරක්ෂක උපකරණය අවශ්‍ය පරිදි ක්‍රියා කරනු ඇති බවට හෝ ඩිජිටල් ආරක්ෂක යතුර ගනුදෙනුකරු විසින් සක්‍රීය කර ඇති බව සහතික වීම සඳහා බැංකුව විසින් සියලු ම සාධාරණ උත්සාහයන් දරනු ඇත. යම් ආරක්ෂක උපකරණයක් හෝ ඩිජිටල් ආරක්ෂක යතුර නිවැරදිව ක්‍රියා නොකරන්නේ නම්, ගනුදෙනුකරු විසින් ඒ බව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු වන අතර, එවැනි ආරක්ෂක උපකරණයක් සම්බන්ධයෙන් බැංකුව වෙත පවතින එක ම වගකීම, ගනුදෙනුකරු වෙත පිරිවැයක් රහිතව ඒ වෙනුවට නව ආරක්ෂක උපකරණයක් ලබාදීම හෝ ඩිජිටල් ආරක්ෂක යතුර ප්‍රතිසක්‍රීය කිරීම පමණක් වන අතර, එසේ වන්නේ,

i. ආරක්ෂක උපකරණය එය නිකුත් කිරීමේ දින සිට දින 90ක් තුළ බැංකුව වෙත ආපසු භාරදීමෙන් පසුව ය, සහ

ii. ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර නිසි ලෙස ක්‍රියා නොකිරීමට හේතු වන හෝ ඊට දායක වන ආකාරයේ ගනුදෙනුකරුගේ පාර්ශ්වයෙන් කිසිදු පැහැර හැරීමක් හෝ නොසැලකිල්ලක් නොමැති බවට බැංකුව සෑහීමකට පත්වන්නේ නම් පමණකි.

(d) ඉහත 9 (c) වගන්තියේ දක්වා ඇති ආකාරයට හැර, මෙම ආරක්ෂක උපකරණයේ හෝ ඩිජිටල් ආරක්ෂක යතුරෙහි සතුටුදායක තත්ත්වය, විකිණීමේ හැකියාව හෝ කාර්යය සඳහා යෝග්‍යතාව සම්බන්ධයෙන් කිසියම් අනුමිත කොන්දේසියක් කඩකිරීම සම්බන්ධයෙන් වගකීම ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර සම්බන්ධයෙන් බැංකුවට වෙනත් කිසිදු වගකීමක් නොමැත. ඊට අමතරව, බැංකුවේ උපදෙස් සහ නිර්දේශවලට අනුකූලව ආරක්ෂක උපකරණය සහ ඩිජිටල් ආරක්ෂක යතුර ආරක්ෂිතව තබාගැනීම සහ/හෝ භාවිතයට ගනුදෙනුකරු අපොහොසත් වීම හේතුවෙන් ගනුදෙනුකරුට විඳින්නට හෝ දරන්නට සිදුවන කිසිදු හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව වගකීමට ලක් කළ නොහැක.

(e) 10 (b) වගන්තිය අදාළ වන්නේ නම් හැර, බැංකුව, HSBC සමූහයේ යම් සාමාජිකයෙකු හෝ එහි අදාළ නිලධාරීන් හෝ සේවකයින් අදාළ ගනුදෙනුවෙහි මුදල හෝ අදාළ ගනුදෙනුවෙන් පමණක් ඍජුව පැන නගින ඍජු හා සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිව තිබූ පාඩුවක් හෝ හානියක් (ඇත්නම්) ඒ සඳහා (එම දෙකින් අඩු වටිනාකම පමණි) පහත දැ මඟින් පැන නගින හෝ ඒ හා සම්බන්ධ ආනුෂංගික සඳහා බැංකුව හෝ HSBC සමූහයෙහි යම් සාමාජිකයෙකු ගනුදෙනුකරු හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ වෙත කිසිදු වගකීමක් හෝ වගවීමක් භාර නොගනියි:-

i. ගනුදෙනුකරු විසින් හෝ අවසර දී ඇත්තේ හෝ නොමැත්තේ වුවද වෙනත් යම් තැනැත්තෙකු විසින් සේවාව (ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර භාවිත කිරීම ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී) භාවිත කිරීම සහ/හෝ එවැනි භාවිත කිරීමක ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරකට ප්‍රවේශ වීම;

ii. යම් සන්නිවේදන ජාලයක බිඳවැටීම, තෙවන පාර්ශ්වයක සේවා සපයන්නෙකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, යාන්ත්‍රික දෝෂයක්, විදුලිය බිඳවැටීමක්, දෝෂ සහගත ක්‍රියාකාරීත්වයක්, බිඳවැටීමක් හෝ උපකරණ, ස්ථාපනය කිරීමක් හෝ පහසුකම් හෝ යම් නීතියක, රීතිවල, රෙගුලාසිවල, චර්යා පද්ධති වල, නියමයන් වල, නියාමන මඟපෙන්වීම් වල හෝ රජයේ නියෝග වල (නීතියක බලය තිබුණ ද නොතිබුණ ද) ප්‍රමාණවත් නොවීමක් ද ඇතුළත්ව, ඊට සීමා නොවී, ප්‍රායෝගිකව බැංකුවේ පාලනයෙන් බැහැර යම් ක්‍රියාවක්, නොකර හැරීමක්, හෝ තත්ත්වයන් මඟින් සිදුවන සේවාවන්ට අදාළ හෝ මාර්ගගත නාලිකාව (නාලිකාවල) ට අදාළ යම් බාධාවීමක්, අන්තර්ඛණ්ඩනයක්, අත්හිටුවීමක්,

ප්‍රමාදයක්, හානියක්, ලබාගත නොහැකි වීමක්, විකෘති වීමක් හෝ වෙනත් යම් බිඳවැටීමක්, (ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර භාවිතය මගින් ආරක්ෂිත කේතය උත්පාදනය කිරීමේ දී ඇතිවන බාධා වීමක්, අන්තර්ඛණ්ඩනයක්, අත්හිටුවීමක්, ප්‍රමාදයක්, හෝ අපොහොසත් වීමක් ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී); සහ

iii. යම් සන්නිවේදන ජාල සපයන්නෙකුගේ යම් පද්ධතියක්, උපකරණයක් හෝ උපාංගයක් තුළ හෝ ඒ හරහා ගනුදෙනුකරු, සේවාව සහ/හෝ සේවාව භාවිතයෙන් ගනුදෙනුකරු විසින් සිදුකරන ලද ගනුදෙනුකරුට අදාළ යම් තොරතුරක් සහ/හෝ දත්ත සම්ප්‍රේෂණය සහ/හෝ ගබඩාකිරීම.

(f) භාවිතය, ආදායම, ලාභය හෝ ඉතිරිකිරීම් අහිමිවීමක් ද ඇතුළත්ව, ඊට සීමා නොවී යම් ආනුෂංගික, වක්‍ර, විශේෂ, සංවිපාකී හෝ ආදර්ශමය පාඩුවීම් සඳහා කිසිදු අවස්ථාවක දී බැංකුව, HSBC සමූහයේ කිසියම් සාමාජිකයෙකු හෝ යම් තොරතුරු සපයන්නෙකු ගනුදෙනුකරුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට හෝ වගකීමට බැඳී නොසිටියි.

10. ගනුදෙනුකරුගේ වගකීම්

(a) ඉහත 10 (b) වගන්තිය අදාළ වන්නේ නම් හැර, සේවාවන් භාවිතය (ආරක්ෂක උපකරණය හෝ ඩිජිටල් ආරක්ෂක යතුර භාවිතය ද ඇතුළත්ව, නමුත් ඊට සීමා නොවී) සහ/හෝ යම් තොරතුරකට හෝ වාර්තාවකට හෝ වෙනත් යම් තොරතුරකට ගනුදෙනුකරු හෝ අවසර දී තිබුණ ද නොතිබුණ ද වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ ප්‍රවේශ වීම මඟින් හෝ ඒ සම්බන්ධයෙන් පැන නඟින සියලු ප්‍රතිඵල සඳහා ගනුදෙනුකරු සම්පූර්ණයෙන් වගකීමට සහ වගවීමට බැඳී සිටියි.

(b) ඉහත 4 (f) වගන්තියට යටත්ව, සහ බැංකුවේ සාධාරණ මතයට අනුව පහත දැ හි ප්‍රතිඵලයක් ලෙස, ගනුදෙනුකරුගේ පාර්ශ්වයේ කිසිදු නොසැලකිල්ලක්, වංචාවක් හෝ වරදක් නොමැති නම් සේවාවන් භාවිත කිරීම හරහා සිදුකරන ලද අනවසර ගනුදෙනු මඟින් සිදුවන අරමුදල් හානිවීම හෝ අස්ථානගතවීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු නොවේ.

i. ඉහත 9 (a) වගන්තියට අනුව බැංකුව විසින් පියවර ගෙන තිබුණේ නම්, එම අවදානම් පාලන සහ කළමනාකරණ පියවර මඟින් වළක්වා ගත හැකිව තිබූ පරිගණක අපරාධයක්;

ii. බැංකුවෙහි මානව හෝ පද්ධති වරදක්; හෝ

iii. බැංකුවෙහි, එහි නිලධාරීන්ගේ හෝ සේවකයන්ගේ දැඩි නොසැලකිල්ල හෝ චේතනාන්විත පැහැරහැරීමක් හේතුවෙන් සිදුවූ අතපසු කළ හෝ වැරදි ලෙස යොමුකළ ගෙවීමක්;

(c) බැංකුවේ, HSBC සමූහයේ වෙනත් යම් සාමාජිකයෙකුගේ, යම් තොරතුරු සපයන්නෙකු හා ඔවුන්ගේ නිලධාරීන් හා සේවකයින්ගේ දැඩි නොසැලකිල්ල හෝ චේතනාන්විත පැහැර හැරීමක් හේතුවෙන් හැර හෝ ඉහත 10 (b) වගන්තිය අදාළ වන්නේ නම් හැර, සේවාව, තොරතුරු සහ/හෝ වාර්තා සැපයීම සම්බන්ධයෙන් හෝ මෙම නීතිරීති හා කොන්දේසි යටතේ බැංකුවේ බලතල හා අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීම හෝ සංරක්ෂණය කිරීම සම්බන්ධව ඔවුන් විසින් හෝ ඔවුන්ට එරෙහිව ගෙන එන සියලු නඩු හෝ නීති ක්‍රියාමාර්ගවල දී බැංකුවට දරන්නට සිදුවන සියලු ම වගකීම්, අයැදීම්, හානි, පාඩු, පිරිවැය, (පූර්ණ හානිපූරණ පදනමින් නෛතික ගාස්තු ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී) ඕනෑම ආකාරයක ගාස්තු හා වියදම් සඳහා ගනුදෙනුකරු බැංකුව, HSBC සමූහයේ වෙනත් යම් සාමාජිකයෙකු, යම් තොරතුරු සපයන්නෙකු හා ඔවුන්ගේ නිලධාරීන් හා සේවකයින් හානිපූරණය කරයි.

11. වෙනස් කිරීම හා අවසන් කිරීම

(a) බැංකුව විසින්, ඕනෑම අවස්ථාවක දී මෙහි 13 වැනි වගන්තිය අනුව දැනුම්දීමකින් යුතුව සහ කිසිදු හේතු දැක්වීමක් නොමැතිව සේවාවන්ගෙන් යමක් හෝ සියල්ල හෝ ගනුදෙනුකරු විසින් භාවිත කිරීම අත්හිටුවීම හෝ අවසන් කිරීම හෝ සිදු කළ හැකි ය.

(b) බැංකුව වෙත පූර්ව ලිඛිත දැනුම්දීමක් ලබාදීම මඟින් ගනුදෙනුකරුට ඕනෑම අවස්ථාවක දී සේවාවන් භාවිතය අවසන් කළ හැකිය.

(c) ඉහත 3 (b), 4, 7, 8, 9 සහ 10 ද ඇතුළත්ව ඊට සීමා නොවී, ගනුදෙනුකරු විසින් සේවාවන් සහ/හෝ සේවාවන් භාවිතය අත්හිටුවීම හෝ අවසන් කිරීමෙන් පසුව ද ඒවායෙහි අර්ථය බලාත්මක කිරීම සඳහා පැවතිය යුතු මෙම නීතිරීති හා කොන්දේසිවල ප්‍රතිපාදන එම අත්හිටුවීම හෝ අවසන් කිරීමට පසුව ද පූර්ණ වශයෙන් බලාත්මකව පවතිනු ඇත. එවැනි අත්හිටුවීමක් හෝ අවසන් කිරීමක් නොතකා, ඉටු කළ යුතුව හෝ සිදුකළ යුතුව ඇති ගනුදෙනුකරුගේ යම් බැඳීමකට හෝ වගකීමකට අදාළ වන තාක් දුරට මෙම නීතිරීති හා කොන්දේසි මඟින් ගනුදෙනුකරු අඛණ්ඩව බැඳී සිටිනු ඇත.

12. සංශෝධන

බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී සහ කලින් කලට මෙම නීතිරීති හා කොන්දේසි සංශෝධනය කිරීම සහ/හෝ අතිරේක නීතිරීති හා කොන්දේසි හඳුන්වා දීම සිදුකළ හැකිය. මාර්ගගත නාලිකාවේ (නාලිකාවල) පළ කිරීම මඟින් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම මඟින් හෝ බැංකුව විසින් යෝග්‍ය යැයි සිතන වෙනත් ආකාරයකින් හෝ බැංකුව විසින් ගනුදෙනුකරු වෙත සාධාරණ දැනුම්දීමක් ලබා දීමට යටත්ව මෙම නීතිරීති හා කොන්දේසිවල යම් සංශෝධනයක් සහ/හෝ එකතු කිරීමක් බලාත්මක වනු ඇති අතර, එම වෙනස්කිරීම බලාත්මක වන දින හෝ ඉන් පසුව ගනුදෙනුකරු සේවාව භාවිත කිරීම හෝ පවත්වාගෙන යාම අඛණ්ඩව සිදුකරන්නේ නම්, ගනුදෙනුකරු ඉන් බැඳී සිටිනු ඇත.

13. සන්නිවේදනය

(a) මෙම නීතිරීති සහ කොන්දේසිවලට අනුව ලබාදිය යුතු වන එක් එක් ආකාරයේ දැන්වීම් සම්බන්ධයෙන් දැනුම්දීමේ ආකෘතිය (ලිඛිතව හෝ වෙනත් යම් ආකෘතියකින්) සහ සන්නිවේදනය කිරීමේ ආකාරය කලින් කලට නිර්දේශ කිරීමට බැංකුවට හිමිකම පවතිනු ඇත.

(b) පෞද්ගලිකව භාරදුන්, තැපෑලෙන් එවන ලද, ෆැක්ස්, ටෙලෙක්ස් හෝ විද්‍යුත් තැපැල මඟින් එවන ලද සන්නිවේදනයන් (පෞද්ගලිකව භාරදී ඇති විට) එසේ පෞද්ගලිකව භාර දුන් අවස්ථාවේ දී හෝ බැංකුව වෙත ගනුදෙනුකරු විසින් ලිඛිතව අවසානයට දැනුම් දී ඇති ලිපිනය වෙත ලබාදෙන අවස්ථාවේදී (තැපෑලෙන් භාර දුන් විට) එම ලිපිනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පවතින්නේ නම්, තැපැල් කිරීමෙන් පැය 48ක් ඇතුළත ද, එම ලිපිනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් පිටත පවතින්නේ නම්, තැපැල් කිරීමෙන් දින හතක් ඇතුළත හෝ (ෆැක්ස් සම්ප්‍රේෂණ, ටෙලෙක්ස් හෝ විද්‍යුත් තැපැල මඟින් යවනු ලබන්නේ නම්) බැංකුව වෙත ගනුදෙනුකරු විසින් ලිඛිතව අවසානයට දැනුම් දී ඇති ෆැක්ස් අංකය හෝ ටෙලෙක්ස් අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය හෝ වෙත යැවීමෙන් පසු වහාම ගනුදෙනුකරු වෙත ලැබී ඇතැයි සැලකෙනු ඇත. ගනුදෙනුකරු විසින් බැංකුව වෙත එවන සන්නිවේදන ඒවා සත්‍ය වශයෙන් ම බැංකුව වෙත ලැබෙන දිනයේ දී භාර දී ඇතැයි සැලකෙනු ඇත.

14. වෙන්කළ හැකි බව

මෙම නීතිරීති සහ කොන්දේසිවල අඩංගු එක් එක් ප්‍රතිපාදන අනෙක් ඒවායින් වෙන්කළ හැකි සහ වෙනස් වන අතර, කිසියම් අවස්ථාවක දී යම් බලප්‍රදේශයක නීති යටතේ එම ප්‍රතිපාදනවලින් එකක් හෝ කිහිපයක් හෝ යම් ආකාරයකින් නීති විරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වුවහොත්, ඉතිරි ප්‍රතිපාදනවල නෛතික භාවය, වලංගු භාවය හෝ බලාත්මක කළ හැකි බවට එමඟින් කිසිදු ආකාරයකින් බලපෑමක් සිදු නොවනු ඇත.

15. අයිතිය අතහැරීම්

බැංකුවෙහි කිසිදු ක්‍රියාවක්, ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් මඟින් මෙම නීතිරීති හා කොන්දේසි යටතේ එහි අයිතීන්, බලය හා ප්‍රතිකර්මවලට හෝ එම අයිතීන්, බලය හෝ ප්‍රතිකර්ම වැඩිදුර ක්‍රියාත්මක කිරීමට බලපෑමක් සිදු නොවනු ඇත. මෙම නීතිරීති හා කොන්දේසි යටතේ ඇති අයිතීන් හා ප්‍රතිකර්ම සමුච්චිත වන අතර, නීතියෙන් සපයා ඇති අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්ම එමඟින් බැහැර නොකෙරේ.

16. විවිධ

(a) ප්‍රශ්නගත ගිණුම හවුල් ගිණුමක් වන අවස්ථාවක දී මෙම නීතිරීති හා කොන්දේසිවල **'ගනුදෙනුකරු'** යනුවෙන් ඇති යෙදුම් මගින් සියලු ම සහ එක් එක් හවුල් ගිණුම් හිමියන් අදහස් වන බවට සැලකෙනු ඇත. මෙම නීතිරීති හා කොන්දේසි මගින් සියලු ම ගනුදෙනුකරුවන් බැඳී සිටින අතර, සේවාවන් භාවිතය මගින් සිදුකරන සියලු ම ගනුදෙනු සඳහා එක් ව හා වෙන් වෙන් ව වගකිව යුතු වේ.

(b) සන්දර්භය මගින් අන් ආකාරයකට අවශ්‍ය නොකෙරෙන්නේ නම්, **'පුද්ගලයා'** යන්නට තනි පුද්ගලයෙකු, ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් සහ සංස්ථාපිත නොකළ පුද්ගල සමූහයක් ද ඇතුළත් වේ.

17. පාලනය වන නීතිය සහ අධිකරණ බලය

(a) සේවාවන් සහ මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති මගින් පාලනය වන අතර, ඊට අනුකූලව අර්ථ නිරූපනය කෙරෙනු ඇත.

(b) බැංකුව සහ ගනුදෙනුකරු යන දෙපාර්ශ්වය ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණවල අනන්‍ය නොවන බලයට යටත් වන නමුත් මෙම නීතිරීති හා කොන්දේසි ඕනෑම නිසි බලය ඇති බලප්‍රදේශයක අධිකරණවල දී බලාත්මක කළ හැකිය.

18. පාලනය වන අනුවාදය

ඉංග්‍රීසි අනුවාදය සහ වෙනත් යම් අනුවාදයක් අතර කිසියම් වෙනසක් පවතින විට මෙම නීතිරීති හා කොන්දේසි වල ඉංග්‍රීසි අනුවාදය බලපවත්වනු ඇත. මෙම නීතිරීති හා කොන්දේසිවල ඉංග්‍රීසි සහ දමිළ පරිවර්තන බැංකුවේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙතින් ලබාගත හැක.

අනුවාදය: **PIBTC2024JUL-SIN**

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් විසින් නිකුත් කරන ලදී - ශ්‍රී ලංකා ශාඛාව